දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය - 2020
---------------------------------------------------------------------------
දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අන්තර්ජාතික සංවර්ධන සමායතනය අතර 2019 අප්‍රේල් 11 දින එළඹි අංක 6346-LK දරන ණය ගිවිසුමේ III (ii) වගන්තිය සහ මුදල් නිදහස් කිරීම් හා මූල්‍ය තොරතුරු ලිපිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය
-----------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර අන්තර්ජාතික සංවර්ධන සමායතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
තෝරාගත් සංවේදී ස්ථාන වල කුඩා වතු හිමියන්ගේ කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ දේශගුණයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකර්මාන්තය සඳහා ජලය සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 25,200කට සමාන වූ එජඩො මිලියන 140 වන අතර ඉන් රු. මිලියන 22,500 කට සමාන වූ එජඩො මිලියන 125 ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 2700 ශ්‍රී ලංකා රජය සහ ප්‍රතිලාභීන් විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ.
ව්‍යාපෘතියේ කටයුතු 2019 මැයි 07 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

1.3 මතය
------

2020 දෙසැම්බර් 31 දිනට දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
--------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරික්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 34 වන වගන්තිය. | මෙම වගන්තිය අනුව ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු කාලානුරූපිව සමාලෝචනය සහ ඇගයීම් කිරීම පහසු වන පරිදි | කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මූලික සාකච්ඡාව පැවැත් වූ | කළමනාකරණ තොරතුරු පද්ධතිය ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කළමනාකරණ තොරතුරු පද්ධතියක් **(MIS)** ස්ථාපිත කර පවත්වාගෙන යාම අවශ්‍ය වුවද, **2021** ජුනි **30** වන විටත් එවැනි පද්ධතියක් ව්‍යාපෘතිය මගින් ස්ථාපිත කර නොතිබුණි. | අතර පවතින වසංගත තත්ත්වය හේතුවෙන් එය සිදුකිරීම ප්‍රමාද විය. ඉදිරි මාස 3ක කාලයක් තුළ කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වෙමු. | |
| (ආ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක **01/2016** දරන **2019** මාර්තු **15** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු **(PSC)** මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | එකඟ වේ. පවතින වසංගත තත්ත්වය සහ ව්‍යාපෘතියේ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් සංවිධානය කිරීමට නොහැකි විය. | චක්‍රලේඛයේ දී ඇති උපදෙස් වලට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් කාලානුරූපීව පැවැත්විය යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ඇමුණුම **2** හි **21** වන උප වගන්තිය. | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | එකඟ වේ. ඇතැම් සංවර්ධන කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කරන ලදී. | රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ **2016** මාර්තු **24** දිනැති අංක **01/2016** දරන චක්‍රලේඛය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ **2016** මාර්තු **24** දිනැති අංක **01/2016** චක්‍රලේඛයේ ලබා දී ඇති උපදෙස් වලට පටහැනිව මූලික අධ්‍යාපනික , වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පරීක්ෂා නොකර පූර්ණ කාලීන සහ අර්ධ කාලීන පදනමින් විශේෂඥයින් හතර දෙනෙකු බඳවා ගෙන තිබුණි. | ව්‍යාපෘතිය සුමටව පවත්වාගෙන යාම සඳහා බඳවා ගැනීම් සිදුකරන අවස්ථාවේදී ලැබුණු අයදුම්පත් සළකා බලා පළාත් මට්ටමේ බඳවා ගැනීම් මුලින් සිදු කරන ලදී. ඉදිරියේදී සුදුසු පරිදි නිවැරදිව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමේදී අවම අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් මෙන්ම පළපුරුද්ද සලකා බැලිය යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘති කටයුතු අවසන් කිරිම ප්‍රමාදවීම

| අංකය | ක්‍රියාකාරකම | ආරම්භ කිරීමට නියමිතව තිබූ දිනය | සම්පූර්ණ කිරීමට නියමිතව තිබූ දිනය | ප්‍රමාදය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASC) 4ක් නවීකරණය කිරීම. | 2020 පෙබරවාරි 27 | 2020 දෙසැම්බර් 18 | මාස 06 | ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASC) දෙකක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර තුන්වැන්නෙහි සියයට 95 ක වැඩ ද අවසන් කර ඇත. ඊට අදාළව ගෙවූ අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන්ම අයකර ගන්නා ලදී. අනෙක් ගොවිජන සේවා මධ්‍යස්ථානයෙහි කටයුතු සමාලෝචනය කරමින් පවතී. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ආ) | මුලතිව් දිස්ත්‍රික්කයෙහි ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASC) 4ක් නවීකරණය කිරීම. | 2020 සැප්තැම්බර් 14 | 2021 ජූලි 06 | මාස 06 | මෙම කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබුවේ පසුගිය වසරෙහි අවසාන කාර්තුවේදී වන අතර මේවන විට ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASC) තුනක වැඩ සියයට 50 කට වැඩි ප්‍රමාණයක් අවසන් කර ඇති අතර අනෙකෙහි සියයට 25 වැඩ නිම කර ඇත. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | අම්පාර දිස්ත්‍රික්කයෙහි ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASC) 4ක් නවීකරණය කිරීම. | 2020 සැප්තැම්බර් 2[illegible] | 2021 ජූලි 06 | මාස 01 යි | මේ වනවිට සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASC) වල වැඩ ආරම්භ කර ඇත. මධ්‍යස්ථාන දෙකක වැඩ සම්පූර්ණයෙන් නිම කර ඇති අතර ඉතිරි මධ්‍යස්ථාන දෙකෙහි වැඩ සියයට 30 බැගින් අවසන් කර ඇත. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**3.2** ව්‍යාපෘති අරමුණුවලින් බාහිර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සේවකයින්ගේ පැමිණීම සටහන් කිරීමට පැමිණීමේ ලේඛනයක් තබා නොගෙන අර්ධකාලීන පදනමින් බඳවාගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නිලධාරීන් 54 දෙනෙකුට පැමිණීම සහ ව්‍යාපෘතියේ සේවය කළ කාලය පිළිබඳ නිසි තක්සේරුවක් නොමැතිව රුපියල් මිලියන 24 ක මුදලක් ගෙවා ඇත. | සියලුම පළාත් කාර්යාල වල පැමිණීමේ ලේඛන පවත්වාගෙන යනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) ඇඟිලි සලකුණු සටහන් තැබීමේ ක්‍රමවේදය පවත්වාගෙනගිය අතර එය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) ස්ථානය මාරු කිරීමත් සමඟ මග හැරී ඇත. | පැමිණීම් වාර්තා කිරීම සඳහා නිසි පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණ ගැටලු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති අධ්‍යක්ෂ, ජල කළමනාකරණය පිළිබඳ ඉංජිනේරු, මෙහෙයුම් කළමනාකරු, ප්‍රසම්පාදන විශේෂඥ, ජල විද්‍යා ජල සම්පත් සංවර්ධන විශේෂඥ වැනි ප්‍රධාන තනතුරු සඳහා බඳවාගැනීම් කර නොතිබුණි. | අය වැය චක්‍රලේඛය හේතුවෙන් මුල් කාලය තුළ බඳවා ගැනීම් සිදු නොවීය. කෙසේ වෙතත් නව අවබෝධතා සමඟ පුරප්පාඩු පිරවීමට කටයුතු සිදුකරමින් පවතී. | ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුර ප්‍රමාදයකින් තොරව පිරවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 සහ 2009 ජූනි 17 දිනැති අංක 09/2009 සහ 09/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන්යට අනුව පැමිණීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතුය. කෙසේවෙතත් මෙම චක්‍රලේඛ උපදෙස්වලට අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයක් පවත්වාගෙන නොයයි. | එකඟ වේ. ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිත කිරීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ඇඟිලි සලකුණු යන්ත්‍රය ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතුය. |